(ඇ) (i) කෘෂි පළිබෝධනාශක සඳහා ආයතන 29

ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය පළිබෝධනාශක සඳහා ආයතන 26

කාර්මික පළිබෝධනාශක සඳහා ආයතන 13

(ii) එක් එක් ආයතනය සහ ඒවායින් ආනයනය කරන ලද පළිබෝධනාශක ප්‍රමාණයන් පහත දැක්වේ.

| සමාගම් අංකය | සමාගමේ නම |
|---|---|
| 01. | A.Baur & Co. (Pvt) Ltd. |
| 02. | Agro Technical Ltd. |
| 03. | Agstar Cropcare (Pvt) Ltd. |
| 04. | BASF Lanka (Pvt) Ltd. |
| 05. | Ceylon Petroleum Corporation |
| 06. | CIC Crop Guard (Pvt) Ltd. |
| 07. | CIC Holdings PLC |
| 08. | CropBeat Industries (Pvt) Ltd. |
| 09. | Harrisons Chemicals (Pvt) Ltd. |
| 10. | Hayleys Agriculture Holdings Ltd. |
| 11. | Hextar (Pvt) Ltd. |
| 12. | Innovative Pesticides Marketing (Pvt) Ltd. |
| 13. | International Crop Sciences (Pvt) Ltd. |
| 14. | J.L.Morison Son & Jones (Ceylon) Ltd. |
| 15. | Kemtek (Pvt) Ltd. |
| 16. | Lankem Ceylon PLC |
| 17. | Mackwoods (Pvt) Ltd. |
| 18. | M-Chems (Pvt) Ltd. |
| 19. | Oasis Marketing Co.(Pvt) Ltd. |
| 20. | Opex Holdings (Pvt) Ltd. |
| 21. | Plantchem (Pvt) Ltd. |
| 22. | Polychemix (Pvt) Ltd. |
| 23. | Sabaragamuwa Fertilizers (Pvt) Ltd. |
| 24. | SunAgro Life Science Ltd. |
| 25. | Unipower (Pvt) Ltd. |
| 26. | Island Wide marketing |
| 27. | Novela (Pvt) Ltd. |

2005 - 2012 දක්වා පළිබෝධනාශක ආනයනය පිළිබඳ සංඛ්‍යා දත්ත

| සමාගම් අංකය | පළිබෝධනාශකය | 2005 (මෙ.ටො.) | 2006 (මෙ.ටො.) | 2007 (මෙ.ටො.) | 2008 (මෙ.ටො.) | 2009 (මෙ.ටො.) | 2010 (මෙ.ටො.) | 2011 (මෙ.ටො.) | 2012 (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | කෘමිනාශක | 168 | 132 | 90 | 154.48 | 42.6 | 149.2 | 106.8 | 107 |
| | වල්නාශක | 153.2 | 128 | 207 | 77 | 77 | 254 | 342 | 387.4 |
| | දිලීරනාශක | 81.2 | 61.8 | 36.6 | 36.18 | 36.18 | 65.6 | 59.6 | 43 |
| 02. | කෘමිනාශක | 125.6 | 88.64 | 50.6 | 19.6 | 36.6 | 21.6 | 22 | 17 |
| | වල්නාශක | 352 | 293 | 281 | 96 | 192 | 176 | 208 | 128 |
| | දිලීරනාශක | 59.5 | 60.3 | 39.5 | 0 | 0 | 0 | 0 | 0 |
| 03. | කෘමිනාශක | 0 | 0 | 23 | 0 | 20 | 1.1 | 22.87 | 52.5 |
| | වල්නාශක | 0 | 0 | 33.8 | 0 | 21.96 | 152.62 | 226.82 | 110.58 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 27.7 | 21 | 30 |
| 04. | කෘමිනාශක | 173.3 | 155.58 | 114.23 | 173.14 | 94.15 | 87.94 | 119.7 | 80.1 |
| | වල්නාශක | 353.3 | 198.4 | 299.1 | 283.2 | 176.2 | 518.8 | 636.4 | 342.28 |
| | දිලීරනාශක | 258 | 128.4 | 141.9 | 183.88 | 72.9 | 150.7 | 47.9 | 126.9 |
| 05. | කෘමිනාශක | 63 | 15 | 31 | 128 | 27.4 | 60 | 24 | 156 |
| | වල්නාශක | 140 | 25 | 290 | 433.6 | 21 | 160 | 128 | 96 |
| | දිලීරනාශක | 30 | 2 | 15 | 34.5 | 17.5 | 17 | 14 | 32 |
| 06. | කෘමිනාශක | 0 | 116.4 | 148.53 | 71.08 | 141.6 | 222.6 | 304 | 229 |
| | වල්නාශක | 0 | 70 | 249.97 | 123.02 | 69.17 | 124 | 248.8 | 555.93 |
| | දිලීරනාශක | 0 | 5.4 | 56 | 17.3 | 61.8 | 81.1 | 87 | 54.8 |
| 07. | කෘමිනාශක | 174.75 | 78.61 | 17.66 | 42.72 | 57.53 | 47.4 | 91.22 | 19.86 |
| | වල්නාශක | 503 | 413.4 | 468 | 272.97 | 40 | 241.42 | 380.6 | 516.6 |
| | දිලීරනාශක | 81.3 | 108.75 | 20 | 107.5 | 110.4 | 200 | 228 | 139 |
| 08. | කෘමිනාශක | 0 | 0 | 0 | 0 | 5 | 7.5 | 10 | 0 |
| | වල්නාශක | 0 | 0 | 0 | 0 | 143.57 | 276.08 | 60.35 | 143.17 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 5 | 6 | 0 | 0 |
| 09. | කෘමිනාශක | 175.5 | 138.8 | 152 | 205.28 | 86.5 | 214.8 | 203.41 | 119 |
| | වල්නාශක | 403.8 | 373 | 462 | 618 | 177 | 774 | 899 | 846 |
| | දිලීරනාශක | 79 | 62 | 43 | 34 | 23.72 | 83.98 | 63 | 14 |
| 10. | කෘමිනාශක | 180.2 | 123.7 | 76.5 | 147.69 | 68.9 | 157.3 | 149.56 | 99.2 |
| | වල්නාශක | 488.7 | 147.2 | 258.4 | 291.3 | 138.05 | 263.43 | 231.7 | 294 |
| | දිලීරනාශක | 110.3 | 123.2 | 97.6 | 183.8 | 148.5 | 157.3 | 162.5 | 164.45 |
| 11. | කෘමිනාශක | 0 | 0 | 0 | 5 | 0 | 16 | 0 | 0 |
| | වල්නාශක | 0 | 0 | 91.35 | 129.3 | 141.22 | 193.8 | 3 | 0 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12. | කෘමිනාශක | 183.84 | 135.07 | 149.53 | 205.64 | 164.84 | 426.48 | 334.58 | 123.8 |
| | වල්නාශක | 0 | 8 | 0 | 17.5 | 16.8 | 37.8 | 22.89 | 22.89 |
| | දිලීරනාශක | 0 | 0 | 12.43 | 24.36 | 0 | 8.39 | 10.78 | 0 |
| 13. | කෘමිනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 15.004 | 20 |
| | වල්නාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 148 | 21.22 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 10 |
| 14. | කෘමිනාශක | 10.66 | 7.3 | 13.91 | 9.28 | 13.79 | 37.74 | 13.66 | 12.08 |
| | වල්නාශක | 0 | 0 | 0 | 16 | 32 | 48 | 16 | 16 |
| | දිලීරනාශක | 35.72 | 30 | 36.72 | 48.5 | 42.6 | 88.86 | 106.2 | 38.88 |
| 15. | කෘමිනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | වල්නාශක | 0 | 0 | 0 | 0 | 0 | 36 | 17.18 | 17.12 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 16. | කෘමිනාශක | 98.89 | 67.86 | 48.06 | 63.65 | 60.69 | 123.18 | 84.73 | 109.75 |
| | වල්නාශක | 524.4 | 358 | 522 | 426 | 354 | 1035 | 671 | 566.5 |
| | දිලීරනාශක | 15 | 28 | 19 | 8 | 18 | 23.5 | 13 | 61 |
| 17. | කෘමිනාශක | 168.4 | 100 | 79 | 122.78 | 26 | 12.7 | 31.4 | 37.02 |
| | වල්නාශක | 468.4 | 257 | 341 | 213.7 | 126.96 | 140 | 124 | 201 |
| | දිලීරනාශක | 90.9 | 119 | 85 | 240.33 | 11.96 | 36.49 | 44.82 | 37.02 |
| 18. | කෘමිනාශක | 0 | 0 | 0 | 48.83 | 0 | 2 | 28 | 0 |
| | වල්නාශක | 0 | 0 | 0 | 165.6 | 0 | 11 | 114.08 | 2 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 3.75 | 0 | 0 | 0 | 0 |
| 19. | කෘමිනාශක | 22.02 | 26 | 27 | 12 | 7.4 | 19.75 | 13.6 | 12 |
| | වල්නාශක | 50 | 44 | 19.5 | 1 | 28 | 69 | 99 | 82.5 |
| | දිලීරනාශක | 19 | 15.5 | 23 | 14 | 6 | 25 | 21 | 16 |
| 20. | කෘමිනාශක | 94.8 | 109.8 | 63 | 37.8 | 38.33 | 160.9 | 31 | 33 |
| | වල්නාශක | 80 | 192 | 205 | 72.4 | 192 | 141 | 22.22 | 94 |
| | දිලීරනාශක | 43.3 | 69.8 | 54.5 | 3 | 10.8 | 27 | 22 | 38 |
| 21. | කෘමිනාශක | 0 | 60 | 49 | 77.5 | 20.5 | 44.56 | 89.05 | 74 |
| | වල්නාශක | 0 | 45.2 | 31 | 30 | 114 | 224 | 384 | 292 |
| | දිලීරනාශක | 0 | 16 | 8 | 45.5 | 14.6 | 36.2 | 27 | 27.75 |
| 22. | කෘමිනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | වල්නාශක | 0 | 494.9 | 153.61 | 281.9 | 227 | 370.88 | 131.99 | 106.17 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 23. | කෘමිනාශක | 0 | 45 | 25 | 23.2 | 22.2 | 22.2 | 14 | 10 |
| | වල්නාශක | 32 | 32 | 153.61 | 32 | 38 | 0 | 176 | 96 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 14.6 | 0 | 12 | 0 |
| 24. | කෘමිනාශක | 0 | 15 | 15.7 | 33 | 63.69 | 0 | 0 | 0 |
| | වල්නාශක | 0 | 48 | 98 | 115.1 | 376.5 | 0 | 0 | 144 |
| | දිලීරනාශක | 0 | 0 | 14 | 8 | 4 | 0 | 0 | 0 |
| 25. | කෘමිනාශක | 48.7 | 54 | 20 | 5 | 10.5 | 29 | 19 | 44 |
| | වල්නාශක | 55.7 | 55 | 56 | 8 | 78 | 120 | 64 | 102 |
| | දිලීරනාශක | 7 | 12 | 9 | 0 | 0 | 0 | 0 | 5 |
| 26. | කෘමිනාශක | 0.07 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | වල්නාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | දිලීරනාශක | 0 | 0 | 21.79 | 31.95 | 0 | 0 | 0 | 0 |
| 27. | කෘමිනාශක | 26 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | වල්නාශක | 69 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | දිලීරනාශක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | කෘමිනාශක | 1713.73 | 1468.76 | 1193.72 | 1585.67 | 1008.22 | 1863.95 | 1727.584 | 1355.31 |
| | වල්නාශක | 3673.5 | 3182.1 | 4220.34 | 3703.59 | 2780.43 | 5366.83 | 5355.03 | 5183.36 |
| | දිලීරනාශක | 910.22 | 842.15 | 733.04 | 1024.55 | 598.56 | 1034.82 | 942.8 | 837.8 |
| | මුළු එකතුව | 6297.45 | 5493.01 | 6147.1 | 6313.81 | 4387.21 | 8265.6 | 8025.414 | 7376.47 |

(iii) කිසිවක් තහනම් කර නැත. මක්නිසාද යත්, සියලුම සමාගම් විසින් පළිබෝධනාශක විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබෙන නිසා.

(ආ) (i) සැපයුම්කරු ලබාදෙන තත්ත්ව සහතිකය හැර ආනයනය කිරීමට පෙර පළිබෝධනාශකවල ගුණාත්මක බව පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් නොමැත. පළිබෝධනාශක ආනයනයේදී ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපයෝගී කරගනු ලබන්නේ එම තත්ත්ව සහතිකයයි.

(ii) මෙහිලා වර්තමානයේ අනුගමනය කරන ක්‍රියාමාර්ගය වන්නේ ආනයනය කෙරෙන පළිබෝධනාශකවල තත්ත්ව සහතිකයක් නිෂ්පාදකයා/ සංයෝජකයාගෙන් ලබාගෙන එය තමා වෙත එවන ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ආනයනකරුගෙන් ඉල්ලා සිටීමයි. නිෂ්පාදනය ශ්‍රී ලංකාවට ආනයනය කළ පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ ආනයනය කළ පළිබෝධනාශක තොගයෙන් අහඹු නියැදි (සාම්පල්) ලබාගෙන එහි රසායනාගාරයේදී විශ්ලේෂණයට භාජනය කෙරේ. ඒවායේ ගුණාත්මක භාවය ගැන පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් දේශීය වෙළඳපළේ අලෙවි කිරීමට අවසර දෙනු ලැබේ.

(iii) සියලුම පළිබෝධනාශකවල මනුෂ්‍යයන්ට හා සතුනට හානිකර ද්‍රව්‍ය අඩංගු වේ. එහෙත් ක්‍රියාකාරී සංඝටක ලෙස ආසනික් අඩංගු පළිබෝධනාශක ආනයනය සඳහා අවසර දෙනු නොලැබේ. එසේ වුවද අංශුමාත්‍ර වශයෙන් ආසනික් මෙන්ම රසදිය, කැඩ්මියම් සහ ඊයම් ඇතුළු විෂ සහිත බර ලෝහ ද්‍රව්‍ය පළිබෝධනාශකවල අන්තර්ගතවීම පළිබෝධනාශක නිෂ්පාදනයේ සාමාන්‍ය තත්ත්වයකි.

(iv) බර ලෝහ වර්ග නවයක් (ආසනික්, කැඩ්මියම්, රසදිය, ඊයම්, කොබෝල්ට්, ක්‍රෝමියම්, ටින්, තැලියම් සහ නිකල්) සහ සයනයිඩ් පරීක්ෂාවට ලක්කිරීම සඳහා පළිබෝධනාශක විදේශ රටවල බලයලත් රසායනාගාරවල හෝ ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනයේදී විශ්ලේෂණයට භාජනය කෙරේ. ඉදිරි වර්ෂයේ සිට මෙම පරීක්ෂණ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් සතු රසායනාගාරයේදී පරීක්ෂාවට ලක්කිරීමට හැකිවන පරිදි එය වැඩිදියුණු කිරීම සඳහා මෙවර අයවැයෙන් ප්‍රතිපාදන ලබා දී තිබේ.

(v) 1994 දී සංශෝධිත 1980 අංක දරන පළිබෝධනාශක පාලන පනතේ 22 වැනි වගන්තියට අනුව (මතභේදයට තුඩු දී ඇති) එවැනි නියැදි පනතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලය ලත් විශ්ලේෂකයන් ලවා ඉටුකරවා ගත යුතු බව දැක්වේ. රජයේ වෛද්‍ය විද්‍යාලයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රසායනාගාරවලදී එබඳු සාම්පල පරීක්ෂා නොකෙරේ.

(vi) අදාළ නොවේ.

(vii)

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් පළිබෝධනාශක නිර්දේශ නොකෙරේ. එම නිර්දේශ ලබාදෙන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතන , තේ පර්යේෂණායතනය, පොල් පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය, උක් පර්යේෂණායතනය සහ අපනයන කෘෂිකර්ම පර්යේෂණ ආයතනය වැනි භෝග පර්යේෂණායතනයන් විසිනි. එසේ නිර්දේශ කරන ලද පළිබෝධනාශක මනුෂ්‍ය සෞඛ්‍යයට පිළිගත නොහැකි මට්ටමින් අවදානම් සහිත නොවේ නම් ශ්‍රී ලංකාවේ භාවිත කිරීමට සුදුසු පළිබෝධනාශක ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබේ. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ කාර්යයට අමතරව මෙරටට ආනයනය කරන පළිබෝධනාශක වෙළඳපළට නිකුත් කිරීමට පෙර ඒවායේ තත්ත්ව පරීක්ෂාවද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉටු කරනු ලැබේ.

(ඇ) (i) පළිබෝධනාශක ශ්‍රී ලංකාවේ භාවිත කිරීම සඳහා බලපත්‍ර ලබාදීම සහ මානව සෞඛ්‍යයට හා පරිසරයට එමඟින් සිදුවිය හැකි අනාතුරුදායක තත්ත්වයන් අවම කරගනිමින් එහි උපරිම ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි පළිබෝධනාශක භාවිතය නියාමනය කිරීමේ බලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුවේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ බොහෝ භෝග ආශ්‍රිත පළිබෝධ පාලනය සඳහා පළිබෝධනාශක නිර්දේශ කිරීමේ කාර්යය කරනු ලබයි . ඒ අනුව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කර තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා රටේ ඒ ඒ දිස්ත්‍රික්කය භාරව කටයුතු කිරීම සඳහා පත් කර ඇති බලයලත් නිලධාරීන් සමඟ පළිබෝධනාශක පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාර පළිබෝධනාශක ආනයනය, සංකලනය, ගබඩා කිරීම, ප්‍රවාහනය, ප්‍රචාරණය සහ අලෙවිය පිළිබඳ නියාමන කාර්යයන් ඉටු කරනු ලබයි. ඉහත කටයුතු කිරීමට පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත සාමාජිකයන් 15 දෙනෙකුගෙන් යුත් ඉහළ මට්ටමේ තාක්ෂණික හා උපදේශක කමිටුවක් පත්කර ඇත. නිලබලයෙන් පත්වන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සහ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත එම කමිටුව 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව පත්කර තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු පළිබෝධනාශක භාවිතයට අදාළ සියලුම පාර්ශ්වයන් විසින් එම කමිටුව නියෝජනය කරයි.

එම තාක්ෂණික හා උපදේශක කමිටුවට තීරණ ගැනීමට උපකාර කිරීම සඳහා උප කමිටු තුනක් තාක්ෂණික කමිටුව විසින් පත්කර ඇත.එනම් කෘෂි පළිබෝධනාශක උප කමිටුව, ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය පළිබෝධනාශක උප කමිටුව සහ කාර්මික පළිබෝධනාශක උප කමිටුව වේ. අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් එම කමිටුවලට පත්කර ඇත. උදාහරණයක් වශයෙන් ගෘහස්ථ හා මහජන සෞඛ්‍ය උප කමිටුවට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද වෛද්‍යවරුන් 9 දෙනෙකුගෙන් , පශු වෛද්‍ය පර්යේෂණායතනයේ , ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙකුගෙන් සමන්විත වේ. එමෙන්ම කාර්මික පළිබෝධනාශක උප කමිටුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මධ්‍යම පරිසර අධිකාරියේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජිතයින්ගෙන් සහ වෛද්‍යවරයෙකුගෙන් සමන්විත වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ මොන යම් ආයතනයක් /පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක ලියාපදිංචිය ලබාගැනීමට උනන්දුවක් දක්වන්නේ නම් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා නියම කර ඇති මූලික තොරතුරු සමඟින් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුවේ. රෙජිස්ට්‍රාර්වරයා විසින් එම තොරතුරු අදාළ උප කමිටුවට යොමු කරනු ඇත. එම පළිබෝධනාශකය ශ්‍රී ලංකාවේ භාවිත කිරීමට සුදුසු බව තීරණය කරන්නේ නම් ඒ බව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත නිර්දේශ කෙරේ. ඒ අනුව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා පළිබෝධනාශක තාක්ෂණ හා උපදේශක කමිටුවේ එකඟත්වය ඇතිව පළිබෝධනාශක පනත ප්‍රකාරව පළිබෝධනාශක ලියාපදිංචිය සිදුකෙරේ.

[ග

මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඊට අයත් පර්යේෂණ ආයතන හරහා කෘෂිරසායන භාවිතය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරයි. පළිබෝධනාශක භාවිතයේ යෝග්‍යත්ව මට්ටම සොයා දැනගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ පර්යේෂකයන් විසින් පර්යේෂණ පවත්වනු ලැබේ. එම විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල පදනම් කරගෙන පළිබෝධනාශක භාවිත පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි.

(ii) : පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොකරයි. නමුත් එමගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ඊට අමතරව "මහින්ද චින්තනය" මත පදනම්ව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සහභාගිත්වයෙන් කෘෂි රසායන අලෙවි හා තාක්ෂණික සහයකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන අතර, එමගින් ගොවීන් දැනුවත් කෙරේ. ඒසේ වුවද ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන්නේ ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මඟිනි. පළාත් තාක්ෂණික ක්‍රියාකාරී කමිටුව හරහා එම වැඩසටහන් සම්බන්ධීකරණය කෙරේ. තවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ කාර්ය පරිපාටිය ගොවීන්ට හඳුන්වා දී ඇති අතර, පළිබෝධනාශක අඛණ්ඩව භාවිත කිරීම පිළිබඳ අවදානම් තත්ත්වය පිළිබඳවද ඔවුන් දැනුවත් කෙරේ.

(ඇ) අදාළ නොවේ.